සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: ශිල්ප කලා	පත්‍රය / வினாத்தாள் / Paper: I	කාලය / காலம் / Time: පැය 01

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✗) ලකුණ යොදන්න.

---

(01) අතීතයේ අප රටේ සිවුසැට කලාවන් පැවතුන බව ඉතිහාසයේ සඳහන් වේ. මෙම සිවුසැට කලාවන් අපට උරුම වූයේ කෙසේ ද?
(1) මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ ය.
(2) සඟමිත් මෙහෙණින් වහන්සේගේ සම්ප්‍රාප්තියත් සමඟ ය.
(3) දේශීය පාරම්පරික ඥානය අතීතයේ සිට ම පැවත ආ නිසා ය.
(4) විජය රජුගේ සංක්‍රමණය වීමත් සමඟ ය.

(02) අප රටේ ආහාර මෙන්ම ජන කලාව ද, විදේශීය රටවලින් පෝෂණය වී ඇත. ලංදේසීන්ගෙන් අප රටට උරුම වූ කලාවක් වන්නේ,
(1) දුම්බර පැදුරු විවීම යි.
(2) වට්ටි පෙට්ටි විවීම යි.
(3) බීරලු රේන්ද ගෙතීම යි.
(4) වෙස් මුහුණු කලාව යි.

(03) කාර්මික ඇඳීමේ දී, ජ්‍යාමිතික උපකරණ කට්ටලය භාවිතයට ගත යුතු ය. සෘජුකෝණාස්‍රයක පාද මත තබන ලද විහිත චතුරස්‍ර යුගලය පහත දැක්වෙන රූප සටහනේ පරිදි තබා ඇත. ඒවා ABC හා CDE ලෙස නම් කර ඇත. BCE කෝණයේ අගය වන්නේ,



(1) අංශක 15 කි.
(2) අංශක 30 කි.
(3) අංශක 25 කි.
(4) අංශක 35 කි.

(04) බහුඅස්‍ර පවුලේ පළමු වැන්න ත්‍රිකෝණය යි. පහත දැක්වෙන රූපයේ ABC ත්‍රිකෝණයේ AB පාදය D දක්වා දික්කර, D හා C ලක්ෂ්‍යයන් යා කළ විට ලැබෙන ACD කෝණය හඳුන්වන්නේ,



(1) සුළු කෝණය නමිනි.
(2) පරාවර්ත කෝණය නමිනි.
(3) මහා කෝණය නමිනි.
(4) සරල කෝණය නමිනි.

(05) ABCD යනු, සමචතුරස්‍රයකි. AB පාදය මත E ලක්ෂ්‍යය ලකුණු කර, AB රේඛාව F දක්වා දික් කර ඇත. AE හා BF අතර දුරවල් සමාන වේ. DE හා CF ලක්ෂ්‍ය යා කළ විට ලැබෙන්නේ,



(1) සමාන්තරාස්‍රය ය.
(2) රොම්බසය ය.
(3) ඍජුකෝණාස්‍රය ය.
(4) ආයත චතුරස්‍රය ය.

(06) ABCD ඍජුකෝණාස්‍රයකි. එහි DC පාදය E දක්වා දික්කර, B හා E ලක්ෂ්‍යයන් යා කළ විට ලැබෙන රූපය වන්නේ,



(1) රොම්බාභය ය.
(2) රොම්බසය ය.
(3) සමාන්තරාස්‍රය ය.
(4) ත්‍රිපීසියම ය.

(07) වෘත්තයක් සමාන කොටස්වලට බෙදීම උපයෝගී කර ගනිමින්, වෘත්තාකාර මල් සකස් කළ හැකිය. වෘත්තයක අරයයන් දෙකකින් හා ඒ තුළ වූ චාපයකින් වෙන් වූ කොටස හඳුන්වන්නේ,

(1) අර්ධ වෘත්තය ලෙස ය.
(2) කේන්ද්‍රික ඛණ්ඩය ලෙස ය.
(3) වෘත්ත ඛණ්ඩය ලෙස ය.
(4) වෘත්ත පාදය ලෙස ය.

(08) ඕනෑම ඇසුරුමක පතරොම (විකසනය) ලබා ගැනීමට, එය ඇලවුම් දාර වලින් ප්‍රවේශමින් ගලවා, දිග හැරගත යුතු ය. ඒ අනුව පහත දැක්වෙන රූපයේ විකසන හැඩය,



(1) වෘත්තාකාර තලය කි.
(2) ඉලිප්සාකාර තලය කි.
(3) සමචතුරස්‍රාකාර තලය කි.
(4) ඍජුකෝණාස්‍රාකාර තලය කි.

(09) අත්කම් නිර්මාණ සැකසීම පහසු කර ගැනීම සඳහා ජ්‍යාමිතික හැඩතල යොදා ගනු ලැබේ. බෝනික්කෙක් මැසීම සඳහා යොදාගන්නා සිලින්ඩරාකාර කොටස් ගණන,

(1) 5 කි. (2) 6 කි. (3) 7 කි. (4) 8 කි.

(10) ඉලිප්සයක් නිර්මාණය කිරීමේ දී ඊට පොදු වූ ක්‍රම කිහිපයක් භාවිත කෙරේ. ඉලිප්සයක් නිර්මාණය කිරීමේ දී ලබාගත යුතු ම මිනුම් වන්නේ,

(1) නාභි දුර හා නියාමන අක්ෂයෙහි දුර ය.
(2) මහා අක්ෂයේ දුර හා නාභි දුර ය.
(3) මහා අක්ෂයේ දුර හා සුළු අක්ෂයෙහි දුර ය.
(4) සුළු අක්ෂයේ දුර හා නාභි දුර ය.

(11) ඈත අතීතයේ වර්ණ ලබා ගැනීම සඳහා ශාක කොටස් මෙන් ම මැටි වර්ග, තෙල් වර්ග හා පාෂාණ වර්ග යොදා ගති. වර්තමානයේ ස්වභාවික වර්ණ භාවිතය ක්ෂය වී යාමට හේතුවක් <u>නොවන්නේ</u>,

(1) ස්වභාවික වර්ණ සකසා ගැනීමට වැඩි කාලයක් ගත වීම ය.
(2) ශාකයන්හි මල්, අල, ගෙඩි, හටගැනීම එක් වාරයකට පමණක් සීමා වීම ය.
(3) වර්ණ නිෂ්පාදනය එක් කාලයකට පමණක් සීමා වීම ය.
(4) යොදා ගන්නා ස්වභාවික ද්‍රව්‍යවල මිල අධික වීම ය.

(12) නූල් හෝ රෙදිවලට වර්ණ යෙදීමට පෙර ඒවායේ ඇති අපද්‍රව්‍ය සෝදා ඉවත් කිරීම "පෙරපිරියම් යෙදීම" ලෙස හඳුන්වයි. පෙරපිරියම් යෙදීමේ දී මුලින් ම කළ යුතු වන්නේ,

(1) පඬු පෙවීම යි. (2) කැඳ ඉවත් කිරීම යි.

(3) මලහරණය යි. (4) විරංජනය යි.

(13) පිළි අලංකරණයේ දී සායම් තැවරීම සඳහා ක්‍රම රාශියක් යොදා ගැනේ. සිදුරු තහඩු සැකසීමට වඩාත් සුදුසු ස්ථිර තහඩු වර්ගය වන්නේ,

(1) ඝන කඩදාසි ය. (2) එක්ස් කිරණ කොළ ය.

(3) ලිනෝලියම් ය. (4) වැනිස්ටාර් ය.

(14) පිළි අලංකරණ ක්‍රියාවලියේ දී එයට යොදන රටාව පළමුවෙන් ම නිර්මාණය කර ගත යුතු ය. එවැනි චිත්‍ර ඇඳීමේ හැකියාවක් නොමැති අයෙකුට සුදුසු වන අලංකරණ ක්‍රමය මින් කුමක් ද?

(1) තාප බන්ධිත ක්‍රමය. (2) සිදුරු තහඩු ක්‍රමය. (3) තිර රාමු මුද්‍රණය. (4) බතික් මුද්‍රණය.

(15) පිළි අලංකරණ ක්‍රියාවලියේ දී මුද්‍රණ සායම් නිසි පරිදි සකසා ගැනීම එම ක්‍රියාවලිය සාර්ථක වීමට හේතු වේ. මුද්‍රණ සායම් සමඟ උකුකුරු කාරකයක් යොදා, සායම් පාප්පයක් ලෙස සකසා ගන්නා මුද්‍රණ ක්‍රමය වන්නේ,

(1) බතික් මුද්‍රණය යි. (2) සිදුරු තහඩු මුද්‍රණය යි.

(3) තාප බන්ධිත ක්‍රමය යි. (4) තිර රාමු මුද්‍රණය යි.

(16) රෙදිපිළිවලට අලංකාර මෝස්තර යෙදීමෙන් එහි වටිනාකම ඉහළ දැමිය හැකිය. බාධක යෙදීම මගින් මෝස්තරවලට වර්ණ යෙදීමේ ක්‍රමයක් වන්නේ,

(1) බතික් මුද්‍රණය යි. (2) සිදුරු තහඩු මුද්‍රණය යි

(3) තිර රාමු මුද්‍රණය යි. (4) තාප බන්ධිත ක්‍රමය යි.

(17) විවිධ රටවල දේශගුණික සාධක, කපු කෙඳිවල ගුණාංග වෙනස් වීමට හේතු වේ. ඉස්තරම් වර්ගයේ කපු කෙඳි වර්ගය මින් කුමක් ද?

(1) ඇමරිකන් උස් බිම් කපු (2) සී අයිලන්ඩ් කපු

(3) මිසර කපු (4) පිලර් කපු

(18) අර්ධ කෘත්‍රිම (පුනර්ජනනිත) කෙඳි වර්ගයක් වන සෙලියුලෝස් කෙඳි සෑදී ඇති මූලද්‍රව්‍ය වන්නේ,

(1) හයිඩ්‍රජන්, ඔක්සිජන්, හා කාබන් ය. (2) කාබන්, හයිඩ්‍රජන් හා නයිට්‍රජන් ය.

(3) හයිඩ්‍රජන් ඔක්සිජන් හා නයිට්‍රජන් ය. (4) ඔක්සිජන්, කාබන් හා පොස්පරස් ය.

(19) රෙදි විවීමේ ක්‍රියාවලිය සිදු වන්නේ කිසියම් රටාවකට අනුව ය. සාරි, සරොම්, වේට්ටි, චිත්ත ආදී රෙදි වර්ග රාශියක් වියාගනු ලබන වියමන් මෝස්තරය තෝරා දක්වන්න.


(1) ජටා වියමන


(2) සැටින් වියමන


(3) චාම් වියමන


(4) හීරී වියමන

(20) රෙදි පිළි නිෂ්පාදනයේ දී එහි පිරිවැය ගණනය කිරීම එම රෙදිවලට අලෙවි මිලක් නියම කිරීමට අත්‍යවශ්‍ය වේ. කපු කෙඳි කිලෝ ග්‍රෑමයකින් සාදන, මීටර් 1000ක් වූ නූල් කැරලි ගණන එම නූලේ අංකය ලෙස ප්‍රකාශ කිරීම,

(1) සරල ක්‍රමය යි. (2) වක් ක්‍රමය යි. (3) ඉංග්‍රීසි ක්‍රමය යි. (4) මෙට්‍රික් ක්‍රමය යි.

(21) රෙදි විවීමේ ක්‍රියාවලිය සඳහා වර්තමානයේ නව යන්ත්‍ර සූත්‍ර බිහි වෙමින් පවතී. අත් යන්ත්‍ර භාවිතයේ දී නූල් එතීමේ උපකරණ කට්ටලයට අයත් වන්නේ මින් කුමන උපකරණය ද?

(1) මල් චක්‍රය (2) පනාව (3) අලුව (4) පුඩු වැල්

(22) රෙදි විවීමේ යන්ත්‍ර අද ඉතා දියුණු තත්තවයක පැවතීම, අති විශාල ලෙස රෙදිපිළි නිෂ්පාදනය කිරීමට හේතු වේ. පහත දැක්වෙන විවීමේ යන්ත්‍ර අතරින් වේගවත් ම යන්ත්‍රය වනුයේ,

(1) මේස යන්ත්‍ර ය. (2) ජවනඩා යන්ත්‍ර ය. (3) බලවේග යන්ත්‍ර ය. (4) චාම් යන්ත්‍ර ය.

(23) නොයෙක් හේතු බලපෑමෙන් මාතෘ පාෂාණය ජීරණය වී මැටි සෑදේ. එම මැටි ජීරණයට බලපාන රසායනික හේතුවක් වන්නේ,

(1) වර්ෂාව ය. (2) හිම පතනය ය. (3) සූර්ය තාපය ය. (4) අම්ල වැසි ය.

(24) පදම් කළ මැටිවලින් ක්‍රම කිහිපයකට විවිධ හැඩයේ හා ප්‍රමාණයේ භාණ්ඩ නිපද වේ. මැටි තහඩු භාවිතයෙන් නිපදවා ගත හැකි භාණ්ඩය මින් කුමක් ද?

(1)
(2)
(3) 
(4) 

(25) මහා පරිමාණයෙන් මැටි පදම් කිරීමේ දී, යන්ත්‍ර කිහිපයක් යොදා ගැනීම එම කාර්යයේ සාර්ථකත්වයට හේතු වේ. එම ක්‍රියාවලියේ දී ෆිල්ටර් ප්‍රෙස් යන්ත්‍රයෙන් සිදු වන්නේ,

(1) ඝන පාෂාණ කුට්ටි කුඩා කොටස්වලට කඩා ගැනීම යි.
(2) කුඩුකරගත් පාෂාණ ඉතා සියුම් ව අඹරා ගැනීම යි.
(3) අඹරාගත් කුඩු, ඇලෙනසුළු අමුද්‍රව්‍ය හා ජලය සමඟ අඹරා ගැනීම යි.
(4) අඹරාගත් මැටි දියරයේ වූ වැඩිපුර ජලය ඉවත් කිරීම යි.

(26) විධිමත් ලෙස පදම්කරගත් මැටිවලින්, විවිධ ක්‍රම භාවිත කරමින්, මැටි භාණ්ඩ සාදා ගැනේ. පහත දැක්වෙන මැටි කොටස් දෙක එකට බද්ධ කිරීමෙන් සාදා ගත හැකි භාණ්ඩයේ නිවැරදි දැක්ම කුමක් ද?




(1)

(2)


(3)


(4)

(34) කෘත්‍රිම ආභරණ සඳහා අද ඉහළ ඉල්ලුමක් පවතී. ඉතා සියුම් මල් , කොළ හා විවිධ හැඩයේ පබලු සෑදීමට වෙළඳපොළෙන් මිල දී ගත හැකි වඩාත් සුදුසු අමුද්‍රව්‍යය වන්නේ,

(1) කඩදාසි පල්ප ය. (2) බයින්ඩර් ගම් ය. (3) පෑන් ක්ලේ ය. (4) පදම් මැටි ය.

(35) සැහැල්ලු සෙල්ලම් සතුන්ට කුඩා දරුවන් ඉතා ප්‍රිය කරයි. මෙහිදී දරුවන්ගේ මනා සෞඛ්‍යයට හිතකරවන පරිදි යොදා ගත යුතු වඩාත් ම නිවැරදි රෙදි වර්ගය වන්නේ,

(1) හැන්ඩ්ලූම් රෙදි ය. (2) බෝවා රෙදි ය. (3) පෙල්ට් රෙදි ය. (4) ප්ලැනල් රෙදි ය.

(36) සුරතල් සතුන් නිර්මාණය කිරීම වර්තමානයේ හොඳ ආර්ථික වටිනාකමක් ලබා දෙන ව්‍යාපාරයකි. බෝනික්කන් හා සුරතල් සතුන් නිර්මාණය කිරීම සඳහා පළමුවෙන් ම කළ යුතු වන්නේ,

(1) රෙදි සෝදා වේලා ගැනීම යි.

(2) පිරවීමට අවශ්‍ය කෘත්‍රිම පුළුන් සැකසීම යි.

(3) අවශ්‍ය පතොරොම් කොටස් කපාගැනීම යි.

(4) අවශ්‍ය රෙදි සපයා ගැනීම යි.

(37) ස්වභාවික මල් දින කිහිපයකට වඩා තබා ගැනීම අපහසු බැවින්, එම අලංකරණ සෑදීමේ දී, ඒවා වැඩි කාලයක් තබා ගැනීම සඳහා, අවශ්‍ය මල් කෘත්‍රිම ලෙස සාදනු ලැබේ. රෙදිවලින් මල් සෑදීමේ දී මල් පෙති ශක්තිමත් කිරීමට එම රෙදිවලට කළ යුතු වන්නේ,

(1) ඉටි ගැල්වීම යි. (2) කැඳ තැවරීම යි.

(3) ස්ටිකර් ඇලවීම යි. (4) ලැකර් ආලේප කිරීම යි.

(38) විසිතුරු නිර්මාණ සඳහා වර්ණවත් කඩදාසි යොදා ගනු ලැබේ. පේපර් ක්විලිං කලාව අනුව කළ හැකි නිර්මාණයක් වන්නේ,

(1) කොට්ට උර ය. (2) හෙයර්බෑන්ඩ් ය. (3) ඉණ පටි ය. (4) සුබ පැතුම් පත් ය.

(39) උද්‍යාන අලංකරණයේ දී සුදුසු මූර්ති හා කැටයම් භාවිත කෙරේ. අවකාශය, සම්පිණ්ඩන අනුපාතය, විවිධත්වය හා නිමාව යන කරුණු වලින් දක්වන්නේ,

(1) උද්‍යාන විද්‍යා මූලධර්ම යි.

(2) උද්‍යාන විද්‍යාවේ ක්‍රම ශිල්ප කිහිපයකි.

(3) මූර්ති නිර්මාණයේ දී පමණක් සලකා බැලෙන ක්‍රම ශිල්ප වේ.

(4) උද්‍යාන විද්‍යාව ඉගෙන ගැනීමේ පියවර කිහිපයකි.

(40) මූර්ති සැකසීම, අවධානයකින් හා ඉවසීමෙන් කළ යුතු වූ කාර්යයකි. මූර්තියක් සැකසීමේ දී පළමුවෙන්ම කළ යුතු වන්නේ,

(1) බඳාමය සැකසීම යි. (2) සැකිල්ල සෑදීම යි.

(3) පාදම සැකසීම යි. (4) නියමිත හැඩය ගැනීම යි.

(27) සකපෝරුව භාවිත කර ඉදිකිරීමේ ක්‍රමයට වටකුරු භාණ්ඩ සාදාගනු ලැබේ. එහි දී පදම්කළ මැටි පිඩ ගෙන පළමුව සිදු කළ යුත්තේ,

(1) මැටි පිඩ සකපෝරුව මත මධ්‍යගත කිරීම යි.

(2) තෙත්කළ සකපෝරුව මතට සවිකර ගැනීම යි.

(3) බඳුනේ බිත්තිය ඉහළට එසවීම යි.

(4) බඳුනේ පතුල නිසි පරිදි සැකසීම යි.

(28) භාණ්ඩ ප්‍රතිනිර්මාණය කිරීම මගින්, එකම හැඩයේ හා ප්‍රමාණයේ භාණ්ඩ විශාල ප්‍රමාණයක් සාදා ගත හැකි වේ. ඒ සඳහා අවශ්‍ය අච්චු තැනීමට සුදුසු වන මාධ්‍යය වනුයේ,

(1) ප්ලාස්ටර් ඔෆ් පැරිස් ය. (2) වයිටිං ය.

(3) සුදු සිමෙන්ති ය. (4) දිය ගැසූ හුණු ය.

(29) මැටි භාණ්ඩවලට අලංකරණ යෙදීම අවස්ථා හතරක දී සිදු කෙරේ. කැටයම් කිරීම, සායම් සීරුම් වැඩ හා පේකඩ ක්‍රමය, සිදුකරන අවස්ථාව වන්නේ,

(1) පළමු පිළිස්සීමෙන් පසු අවස්ථාවේ දී යි. (2) දෙවන පිළිස්සීමෙන් පසු අවස්ථාවේ දී යි.

(3) තෙවන පිළිස්සීමෙන් පසු අවස්ථාවේ දී යි. (4) පළමු පිළිස්සීමට පෙර අවස්ථාවේ දී යි.

(30) අද වෙළෙඳපොළේ පැච්වර්ක් නිර්මාණ සඳහා ඉල්ලුම ඉහළ මට්ටමක පවතී. පහත දක්වෙන පැච්වර්ක් නිර්මාණයට පතරොම් කොටස් කීයක් අවශ්‍ය වේ ද?



(1) කොටස් 4

(2) කොටස් 5

(3) කොටස් 6

(4) කොටස් 8

(31) පැච්වර්ක් නිර්මාණයේ දී, මැසීමෙන් හා ඇලවීමෙන් රෙදි කැබැලි බද්ධ කිරීම සිදු කෙරේ. මැසීමේ දී රෙදි කැබැලි එකිනෙකට සම්බන්ධ කිරීමට යොදන මැහුම් ක්‍රමය වන්නේ,

(1) දම්වැල් මැස්ම ය. (2) පිස්මේන්තු මැස්ම ය.

(3) බූලියන් මැස්ම ය. (4) ලේසි ඩේසි මැස්ම ය.

(32) උත්සව අවස්ථා සඳහා විවිධාකාර වූ මල් සැකසුම් නිර්මාණය කරනු ලැබේ. මංගල අවස්ථාවල වැඩි වශයෙන් භාවිතවන මල් වර්ගය වන්නේ,

(1) ස්වභාවික මල් ය. (2) කෘත්‍රිම මල් ය. (3) වියළි මල් ය. (4) කඩදාසි මල් ය.

(33) දුර බැහැරින් ගෙන එන ස්වභාවික මල්, දින කිහිපයක් පර නොවී තබා ගැනීම ඉතා වැදගත් වේ. ස්වභාවික මල් කල්තබාගැනීමට කළ හැකි උපක්‍රමයකි,

(1) පොලිතීන් බෑගයක දමා සුළං පුරවා කට ගැට ගැසීම.

(2) ශීතකරණයක ගබඩා කර තැබීම.

(3) මල්වල නටු අගිස්සට ඉටි වක් කිරීම.

(4) සබන් මිශ්‍ර ජලයේ මල් නටු ගිල්වීම.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: ශිල්ප කලා	පත්‍රය / வினாத்தாள் / Paper: II	කාලය / காலம் / Time: පැය 02

සැලකිය යුතුයි:

- සළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) ඔබ ඉගෙනුම ලබන අධ්‍යාපන කලාපයේ පාසල් කිහිපයක පමණක් ශිල්ප කලා විෂය පවතින බැවින්, කලාපයේ සියලුම පාසල් මෙම විෂය පිළිබඳව දැනුවත් කිරීම සඳහා, ශිල්ප කලා නිර්මාණ ප්‍රදර්ශනයක් පැවැත්වීමට කලාප අධ්‍යාපන කාර්යාලය මගින් යෝජනා කර ඇතැයි සිතන්න. ශිල්ප කලා විෂය පවතින පාසල් සඳහා මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීමේ කටයුතු පවරා ඇත. විෂය භාර ගුරුභවතුන් හා විෂය හදාරණ සිසු සිසුවියන්ට මෙම කටයුතු සූදානම් කිරීමට සිදු වනු ඇත.

(i) ශිල්ප කලා ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ ඉදිරිපත් කළ හැකි ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.

(ii) ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා කෘත්‍රිම මල් සැකසුම් භාවිත කිරීමට යෝජනා කර ඇත. කෘත්‍රිම මල් භාවිතයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

(iii) ඔබ පාසලේ ළමුන් වෙන්කර හඳුනා ගැනීම සඳහා ලාංඡනයක් පැළඳීම අවශ්‍ය වන අතර, එම ලාංඡන සෑදීමට සමපාද ත්‍රිකෝණයක්, කවකටුව භාවිතයෙන් නිර්මාණය කරන්න.

(iv) ප්‍රවේශ දොරටුව සඳහා තොරණක් සකස් කිරීමට යොජනා කර ඇත. ඒ සඳහා ගොක් කොළ හා පොල් කොළ භාවිතයට ගෙන, යොදා ගත හැකි හිරි වියමන් ක්‍රම දෙකක් යෝජනා කරන්න.

(v) ඉහත (iv) හි සඳහන් වියමන් ක්‍රම දෙකින් ඔබ කැමැති වියමනක රූපසටහනක් ඇඳ දක්වන්න.

(vi) බිත්ති සැරසිලි නිර්මාණය කිරීම සඳහා සුදුසු ක්‍රම දෙකක් යෝජනා කරන්න.

(vii) වූල් භාවිත කරමින් විවිධ නිර්මාණ සිදු කරනු ලැබේ. වූල් භාවිත කර සකස් කරනු ලබන, ළදරුවෙකුට සුදුසු ඇඳුම් දෙකක් නම් කර, එහි රූපිය පෙනුම ඇඳ දක්වන්න.

(viii) රෙදි විවීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ස්වභාවික කෙඳි වර්ග හතරක් නම් කරන්න.

(ix) මැටි භාණ්ඩ නිෂ්පාදනය කරන ක්‍රම දෙකක් සඳහන් කර, ඒවාට උදාහරණ එක බැගින් ඇඳ දක්වන්න.

(x) උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා යොදාගත හැකි මාධ්‍ය දෙකක් නම් කර, එසේ සාදාගත හැකි උද්‍යාන අලංකරණ නිර්මාණයක රූපසටහනක් ඇඳ දක්වන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) ජ්‍යාමිතික හැඩතල නිර්මාණය කිරීම ශිල්ප කලා නිර්මාණවල දී අත්‍යවශ්‍ය වේ. විවිධ නිර්මාණ කිරීමේ දී එකිනෙකාගේ අභිරුචිය පරිදි සුදුසු පරිමාවකට අනුව මූලික සැලැස්ම සකස් කිරීමට ජ්‍යාමිතික ඇඳීම යොදා ගනු ලැබේ.

(i) අරය 5 cm ක් වූ වෘත්තයක් නිර්මාණයක් කර, එය සමාන කොටස් 12කට බෙදන්න. (ලකුණු 02)

(ii) කේක් ඇසුරුමක් සඳහා සුදුසු පතරොමක් ඇඳ දක්වන්න. (ලකුණු 04)

(iii) සිලින්ඩරය, පංචාස්‍රය, ඉලිප්සය යන හැඩයන්ගෙන්, එක් හැඩයක් උපයෝගී කර ගනිමින් සාදාගත හැකි භාණ්ඩයක් නම් කර, එය නිර්මාණය කර ගන්නා අකාරය පියවර වශයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(03) අතීතයේ දී මෙන්ම වර්තමානයේ දී ද රෙදිපිළි අලංකරණය සඳහා විවිධ ක්‍රම යොදා ගනු ලැබේ.

(i) සායම් භාවිතයෙන් සිදු කරනු ලබන රෙදිපිළි අලංකරණ ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) "පෙර පිරියම් ක්‍රියාවලිය" පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 04)

(iii) බතික් නිර්මාණයක් සිදු කරන ආකාරය පියවර වශයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(04) පොළොවෙන් ලබා ගන්නා මැටි විවිධ ක්‍රම භාවිත කරමින් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගැනේ.

(i) මැටිවල පවතින භෞතික හා රසායනික ගුණ නම් කරන්න. (ලකුණු 02)

(ii) මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා යොදා ගන්නා පෝරණු වර්ග තුන නම් කරන්න. එම පෝරණුවල භාවිත කෙරෙන උපකරණ දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පදම් මැටි භාවිත කරමින් මැටි භාණ්ඩයක් නිෂ්පාදනය කර ගන්නා ආකාරය , පියවර වශයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(05) විවිධ කෙඳි වර්ග භාවිතයෙන් සකස් කරගන්නා ලද නූල් යොදා ගැනීමෙන් රෙදි නිෂ්පාදනය සිදු කරනු ලැබේ.

(i) කෙඳි හඳුනා ගැනීම සඳහා සිදු කළ හැකි සරල පරීක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) රෙදි විවීම සඳහා යන්ත්‍ර ගත කිරීමට නූල් දිග්ගසා ගැනීම කළ යුතු ය. නූල් දිග්ගැසීමේ දී යොදා ගන්නා උපකරණ කට්ටලය සඳහන් කර, ඉන් කෙරෙන කාර්යය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කමිස රෙදි නූල් හැදයක දිග මීටර් 200 කි. එහි පළල සෙ.මී. 90 කි. එහි දික් සෙන්ටිමීටරයක් සඳහා නූල් අංකන (නොම්මර) $\frac{2}{40}$ කි. නූල් පොටවල් 80ක් යෙදුවේ නම්,

(අ) එම නූල් හැදය සඳහා වැයවන දික් නූල් ප්‍රමාණය සොයන්න.

(ආ) දික් නූල් කිලෝ ග්‍රෑමයක මිල රු. 600.00 ක් නම්, දික් නූල් සඳහා වැයවන මුදල සොයන්න. (ලකුණු 04)

(06) විසිතුරු නිර්මාණ කිරීමේ දී විවිධ ද්‍රව්‍ය හා විවිධ මාධ්‍ය යොදා ගැනීම සිදු කෙරේ.

(1) මනාලියකගේ මල් කළඹක් සඳහා සුදුසු ආකෘතියක් අඳින්න. (ලකුණු 02)

(ii) පැච්වර්ක් ක්‍රමය භාවිත කර, කුෂන් කවරයක් සාදාගන්නා ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න. (ලකුණු 04)

(iii) සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණයේ දී, බලු පැටියෙක් හෝ සුරතල් වලස් පැටියෙක් (ටෙඩිබෙයා) නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(07) උද්‍යාන අලංකරණය සඳහා විවිධ උපාංග නිර්මාණය කිරීම වර්තමානයේ ඉතා ජනප්‍රියව ඇත.

(i) උද්‍යාන මූර්තියකට සුදුසු නිර්මාණයක රූප සටහනක් හෝ පේපර් ක්විලින් ක්‍රමයට සකස් කළ ආරාධනා පත්‍රයක රූපසටහනක් ඇඳ වර්ණ ගන්වන්න. (ලකුණු 02)

(ii) පැන් ක්ලේ භාවිත කර මාලයක් සකස් කරගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(iii) පොකුණක් අසලට සුදුසු උද්‍යාන මූර්තියක් ඇඳ, ඔබ කැමැති මාධ්‍යයක් උපයෝගී කර ගනිමින් එය සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)